

# අපේ ලොකු මහත්තයා

සිරිමා මුදන්නායක

අප ගම් ප්‍රදේශය නගරයට ආසන්නව පිහිටි ඉතා රමණීය ග්‍රාමයකි. ඒ ග්‍රාමයේ ආණ්ඩුවේ ඉස්කෝලය (එවකට භාවිතා වූයේ එලෙසිනි) සහ ඉංග්‍රීසි ඉස්කෝලය යන නමින් මිශ්‍ර පාසැල් දෙකකි. මමත්, පොඩි අයියාත් කුඩා කළ ඉගෙන ගත්තේ මෙම ඉංග්‍රීසි පාසලේය. මෙම පාසලේ මුල් ගුරුතුමා හෙවත් ප්‍රින්සිපල් ඉතා තේජවන්ත කෙනෙක් වූ අතර අඩි 6ක් පමණ උසැති හීන්දෑරි ශරීරයකට නෑකම් කියන පුද්ගලයෙකි. ඔහු දෙස කිසිම කෙනෙක් හිස ඔසවා කථාකර නොමැති අතර ඔහු ආසන්නයේද ඉඳ ගැනීමට බයක් ගන්නේ ඇයිදැයි මට නොතේරේ. ඒ ඔහු වෙත තිබෙන ගෞරවය නිසා බව මට මෑතකදී වැටහුනි.

මේ අපූරු ඉස්කෝලේ මහත්තයා අත නිතරම වාගේ දිගු වේවැලක් තිබෙන අතර අනිත් අතේ පාසැලේ සීනුවද වේ. සීනුව අතේ තිබූ නිසා ළමයි ඔහු ප්‍රින්සිබල් කීවාදැයි මම නොදනිමි. ඔහු අකුරට වැඩකරන පුද්ගලයෙක් වන අතර ප්‍රමාද වී පාසැලට පැමිණෙන ළමුන්ට වේවැල් කසාය දීමද ඔහුගේ සිරිතකි. පාසැල පටන්ගත් පසු ගේට්ටුව මුරකිරීම ඔහුගේ දිනපතා රාජකාරිය වන අතර ප්‍රමාද වී පැමිණෙන සිසුවකුට අනිවර්යෙන්ම එම සංග්‍රහය විඳගෙන පන්තියට යෑමට සිදුවේ. එමනිසා ළමෝ උදෑසනම පාසැලට පැමිණීම පුරුද්දක් කරගත්හ. අපේ නිවස සහ පාසැල අතර දුර ප්‍රමාණය මීටර් 50 පමණ වේ. දිනක් ප්‍රමාද වී මා පාසැලට පැමිණෙන විට දුරතියාම ඔහු ගේට්ටුව මුරකරනවා දුටිමි. ආපසු හැරුණු මා නැවතුනේ නිවසට දුවගොසිනි. පසුදින පාසැල් යාම ප්‍රතික්ෂේප කිරීම නිසා අම්මා මා ඇරලවන්න පාසැලට ආවාය. මා දුටු විගසම ඉස්කොලේ මහත්තයාට පෙර දින සිදුවූ සිද්ධිය මතක් විය. ඔහු මා අල්ලා මව ඉදිරියේම අතට වේවැල් පාර දෙකක් දුන්නේය. ප්‍රමාද වී පැමිණීම හා ආපසු හැරී දිවීම වෙනුවෙනි.

පන්තියේ ගුරුතුමෙක් නොමැති අවස්ථාවල ඔහු අපේ ගුරුතුමා විය. වේවැලත්, ඉංග්‍රීසි පොතත් ඇතිව පන්තියට ඇතුල්වන දසුන දකින විට අපි සැවොම බයෙන් ත්‍රස්ත වෙමු. ඒ අනිවාර්යයෙන්ම කිහිප දෙනෙකුට හෝ වේවැල් පාරක් හා ඊට අමතරව බිම දණ ගසා සිටීමට පමණක් නොව පුටුව උඩ නැග සිටීමට සිදුවන හෙයිනි. ඔහු ඉතා අපූරුවට ඉංග්‍රීසි උගන්වනවා පමණක් නොව අපෙන් ප්‍රශ්නද විමසයි. ඒ අවස්ථාවේ වචනයක අකුරක් හෝ උච්චාරනය වැරදීමක් වුවහොත් වේවැල් පහර වදී. ඒ නිසා ඔහු පන්තියට පැමිණෙනවාට අපි බොහෝ සෙයින්ම අකමැති වෙමු.

මේ අපූරු ඉස්කෝලේ මහත්තයට ඉතා හොඳ වර්ගයේ බලු තඩියෙක්ද සිටින අතර ඌගේ නම වයිට් වේ. ඌ අපේ ඉස්කෝලේ මහත්තයා යන සෑම තැනකම නැට්ට වන වනා ගමන් කරන අතර ඔහුගේ ආරක්ෂකයාද වේ. ඒත් කිසිම දිනක යටකී වේවැලෙන් ඌට තඩිබානවා අපි දැක නැත. ඌද කිසිම දවසක ළමයෙකුට බුරා පැන හෝ හපාකා බවක් අප අසා නැත.

අපේ ඉස්කෝලේ මහත්තයාට ළමයි ඉංග්‍රීසි කොපමණ ඉගෙන ගත්තත් මදිය. ඒ නිසා රෑ ඉස්කෝලයක් පටන්ගෙන අමතරව ඉංග්‍රීසි උගැන්වීය. අමතර පන්තිදමා මුදල් හඹා යන මෙම අවධියක ඔහු කිසිදු ළමයෙක්ගෙන් මුදල් අයකර ගත්තේ නැත. ළමයි ඉංග්‍රීසියෙන් කථාකිරීම තරම් සතුටක් තමන්ට නැති බව ඔහු පවසනවා අප අසා ඇත්තෙමු. පිරිමි ළමයි සඳහාම මෙම රෑ ඉස්කෝලේ පවත්වන අතර "කෙල්ලෝ මට පරිස්සම් කරන්න බැහැ. උඹලා ගෙදර ගිහින් ඒකකලාට නංගිලාට අද මම උගන්වපු පාඩම කියලා දීපල්ලා" ඔහු ශිෂ්‍යන් අමතන්නේ ඒ විලසිනි. ඒ ඔහුගේ හැදියාවක් නැති කමක්දැයි අපි කිසි විටකත් නොසිතුවෙමු.

ඉස්කෝලේ මහත්තයාට පාසලේ දීප්තිමත් සිසුහු කීපදෙනෙක් සිටිති. ඔහු ඒ අය ගැන කථා කරන්නේ ආඩම්බරයෙනි. ඒ අතරින් මගේ ලොකු අයියාද කෙනෙකි. ජ්‍යෙෂ්ඨය සමත් වීමෙන් පසු ඔහුට රැකියාවක් ලැබෙනතුරු ඉස්කෝලේ ඉගැන්වීමට අවස්ථාවක් ලබාදී තිබුනි. නමුත් මගේ ලොකු අයියා උගන්වන පන්තියේ එක්තරා ප්‍රියකරු ගෑණු ළමයෙකු සමග ආලවන්ත කමක් පටන් ගත්තේය. මෙය දැනගත් ඉස්කෝලේ මහත්තයා කලබල විය. අපේ පියාද "මූසිල වගේ වැඩකරන්න එපා යැයි" කීවා. නමුත් එය තඹ සතයකටවත් අයියා මායිම් නොකළේය. අන්තිමේදී අයියා ගුරු සිත රිදවා පාසලෙන් අස්වුනා පමණක් නොව යටකී ගෑණු ළමයාද විවාහ කර ගත්තේය. මේ නිසා ඉස්කෝලේ මහත්තයාගේ හිත රිදුනිද තවමත් පාසැලේ ඉගෙන ගන්නා මටවත්, පොඩි අයියාටවත් කිසිදු දිනක වෛරයන් ඇතිකර නොගත්තේය. ඔහුට අපි දෙදෙනාද අන් අය හා සමාන විය.

අපේ පියා ගම් මුලාදෑනියකු වූ නිසා ඉස්කෝලේ මහත්තයා විවේක ලද දිනවල අපේ ගෙදර ආවා ගියා මතකය. ඒ එන සෑම අවස්ථාවකදීම පොඩි අයියාත් මමත් දොරමුල්ලේ සැගවී සිටියෙමු. ඔහු ගියා යයි කියා අම්මා ඇත් අපිට අඬගහනතුරු අපි එළියට එන්නේ නැත. ඉස්කෝලේ මහත්තයා අප පියා ඇමතුවේ "මූඩ්ලියර්" කියලා. ඇයි එසේ කථා කරන්නේ යයි අම්මාගෙන් විමසුවද අය ද කිසිවක් නොකියා නිහඬ විය. ඒ ඇයටද නොතේරුණා විය හැක.

දවසින් දවස ඉංග්‍රීසි උගතුන් බිහිවෙන අපේ ඉංග්‍රීසි පාසලේ ප්‍රින්සිපල් හෙවත් මේ අපූරු ඉස්කෝලේ මහත්තයා හදිසියේ හර්දයාබාධයක් සෑදී අප අතරින් සමුගන්න දින හැමෝටම කණාගාටුදායක දිනයක් විය. එදා පාසැල වසා දමා ඔහුගේ දේහය පාසැලේ ශාලාවක තැන්පත් කර තිබුනි. මිනිසුන් වැලනොකැඩී ඔහුගේ දේහයට අවසන් ගරු බුහුමන් දැක්වීමට පෙළගැසී සිටියහ. මාද අම්මා සමගින් වරුවක් පමණ පෝලිමේ ඉඳ ඔහුට අවසන් ගරු බුහුමන් දැක්වූවා මතකය. ළමෝ අඩනවා දැක මා කෑගසා ඇඩුවෙමි. ඒ දුකටද නැතිනම් මින්පසු වේවැල්පාර නොකන නිසාවෙන්දැයි එදා මට නොතේරුනි. සියලු දෙනාගේම සෝසුසුම් මැද අපේ ප්‍රින්සිපල් අවසන් ගමන යනවිට අපි හැමෝම පාසලේ කොඩි අතැතිව සුසාන භූමිය තෙක් ඔහු ඇරලන්න පෙරහැරක් සෑදී ගමන් කළෙමු. අන්තිමට අපි ආපසු හැරී නිවස්කරා ඒමට පටන්ගත් නමුත් ඔහුගේ ආදරණීය බල්ලා වයිට් පමණක් ඔහුගේ තනියට සොහොන් කොට උඩ වැතිර සිටිනවා දැක අපි හැම දෙනාටම සංවේගයක් ඇති වුනෙමු. අදටත් ඉස්කෝලේ මහත්තයා නමින් අපේ ඉංග්‍රීසි පාසල නම්කර තිබෙන්නේ ඔහු වෙත කරන ගෞරවයක් වශයෙනි.

# කතිකාව

කල්දෙමුල්ල

